# පළාත් සභා හා ගුවන් යානා ප්‍රහාර

එක්සත් ජනතා නිදහස් සංධානය බලාපොරොත්තු වූ පරිදි ම උතුරුමැද හා සබරගමුව පළාත් සභා ජයග්‍රහණය කෙළේ ය. පළාත් දෙකෙහි ආසන සියල්ලෙහි ම ජයග්‍රහණය සංධානයට හිමි වූ අතර, ප්‍රතිශතයක් ලෙස ගත්කල පොළොන්නරුව, කෑගල්ල, රත්නපුර දිස්තික්කවල 2005 වසරේ පැවති ජනාධිපතිවරණයට වඩා ඡන්ද ලබාගැනීමට සංධානයට හැකි විය. අනුරාධපුරයෙහි ඉතා සුළු ප්‍රතිශතයකින් එනම් 0.4% කින් ඡන්ද අඩුවිය. එක්සත් ජාතික පක්ෂයේ ඡන්ද ප්‍රතිශතයක් ලෙස ගත්කල සෑම දිස්ත්‍රික්කයක දී ම අඩු විය. සංධානයට සබරගමුවේ දී 55.4%ක් ද උතුරු මැද පළාතෙහි දී 56.4%ක් ද ඡන්ද හිමිවිය. එ ජා පක්ෂයට ඒ පළාත්වල පිළිවෙළින් ඡන්ද 40.5% ක් හා 37.6%ක් පමණක් හිමි විය. ජනාධිපතිවරණයෙහි දී සංධානයෙහි සිටි ජ වි පෙ මෙවර සංධානය සමග නොවූ බව ද මැතිවරණ ප්‍රතිඵල සංසන්දනය කරන විට අමතක නොකළ යුතු ය.

රන්ජන් රාමනායක හා ජානක පෙරේරා මහතාට ප්‍රතිඵල වෙනස් කිරීමට තබා ප්‍රතිශතයක් ලෙස ඡන්ද වැඩිකරගැනීමටවත් නො හැකි විය. ඒ මහත්වරු තම තමන්ගේ ක්ෂේත්‍රවල දක්ෂයන් විය හැකි ය. එහෙත් එපමණකින් ඔවුන්ට ඡන්දදායකයන් ආකර්ෂණය කළ හැකි නො වෙයි. ඔවුහු දේශපාලනඥයෝ නො වෙති. ඡන්දදායකයන් ඔවුන්ට තම තමන් තරගකළ දිස්තික්කවල වැඩි මනාප දී ඇති බව සැබෑ ය. එහෙත් ඒ එ ජා ප මැතිවරණ ව්‍යාපාරයෙහි ලක්ෂණයක් පමණකි. ඒ පක්ෂයෙහි නායකයන්ට සාමාන්‍යයෙන් මනාප වැඩි සංඛ්‍යාවක් හිමිවෙයි. ඒ මහතුන් දෙදෙනා එ ජා පක්ෂයට ඡන්ද ලබාදුන්නා නො වේ. ඔවුහු එ ජා පක්ෂයට ලැබුණු ඡන්දවලින් විශාල මනාප ප්‍රමාණයක් ලබාගත්හ.

විජය කුමාරතුංග මහතාගේ සිංහල බෞද්ධ විරෝධී ප්‍රතිපත්ති කෙසේ වෙතත් ඒ මහතා නළුවකු පමණක් නොව නිර්දය ලෙස තීන්දු ගත් දේශපාලනඥයෙක් ද විය. යම් අයුරකින් චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය වෙනුවට ඔහු ජනාධිපති වී නම් ඊළම දී බොහෝ කල් ය. ඉන් අදහස් කරන්නේ කුමාරතුංග මහත්මිය ඊළම නොදෙන බව නො වේ. ඇය ද සිංහල බෞද්ධ විරෝධී වූ නමුත් ඇයට ජනතා මතයට කෙලින් ම විරුද්ධව යෑමට නො හැකි විය. එහෙත් කුමාරතුංග මහතා එසේ නො වී ය. ඔහු ශ්‍රී ල නි පක්ෂයෙන් අස්වීම කෙටිකාලීන ව සමහරවිට ශ්‍රී ල නි පක්ෂයට පාඩුවක් වන්නට ඇත. එහෙත් දීර්ඝ කාලීනව ඉන් පක්ෂයට වූයේ සෙතකි.

එ ජා පක්ෂයට වෙනත් නායකයකු සිටිය ද ඡන්ද ප්‍රතිඵලයෙහි විශාල වෙනසක් නොවනු ඇත. ඒ පක්ෂයෙහි ප්‍රශ්නය නායකත්ව ප්‍රශ්නයක් නොව ප්‍රතිපත්ති පිළිබඳ ප්‍රශ්නයකි. සංධානය මැතිවරණයෙහි දී යුද්ධය විකිණී යැයි කියන ඇස් බී දිසානායක මහතා වැන්නකු පක්ෂ නායකත්වයට පත්විණි ද, ඒ පක්ෂයට පරාජය සහතික ය. පක්ෂය ජයගැනීමට නම් කළ යුත්තේ නායකයා මාරුකිරීම නොව ප්‍රතිපත්ති වෙනස් කිරීම ය. එහෙත් ඔවුන් නොකරන්නේ ද එය ම ය. එ ජා පක්ෂය තම විජාතික බටහිරගැති සිංහල විරෝධී ප්‍රතිපත්ති දිගින් දිගට ම ගෙන යයි.

එහෙත් එ ජා පක්ෂයේ පරාජය ජ වි පෙරමුණේ පරාජය සමග සැසඳීමේ දී එතරම් සැලකිය යුත්තක් නො වෙයි. එ ජා පක්ෂයේ විජාතික බටහිර ගැති ප්‍රතිපත්ති පිළිබඳ ජනතාවට මනා අවබෝධයක් වෙයි. ජ වි පෙරමුණ එසේ නො වෙයි. ඒ පක්ෂය පසුගිය කාලයෙහි යම් ජාතික ප්‍රතිපත්තියක් අනුගමනය කෙළේ ය. එසේ වුවත් ඒ පක්ෂය මාක්ස්වාදයෙන් නො කැඩිණි. එක් අතෙකින් ගත්කල ජ වි පෙරමුණේ යම් ස්ථිර ප්‍රතිපත්තියක් ඉන් පිළිබිඹු වන අතර ජාතිකත්වයට ඉල්ලමක් මතු වී ඇති බැවින් හුදෙක් බලය ලබාගැනීම සඳහා තමන් එතෙක් මළකඳක් යැයි හඳුන්වා බිම තබා සිටි ජාතිය නැවත කරට ගත් ඇතැම් පක්ෂයක් මෙන් ක්‍රියාකිරීමට ජ වි පෙ පෙළඹී නැත. එසේ වුවත් මෙරට ජනතාව අද ජාතිකත්වය මත පදනම් නොවන දේශපාලන පක්ෂ ප්‍රතික්ෂේප කරන බවත් මාක්ස්වාදය යනු තිඹිරිගෙහි දී ම මියගිය මළකඳක් බවත් ජ වි පෙරමුණට නොතේරීම අභාග්‍යයකි. රුසියාවේ ජයග්‍රහණය කෙළේ මාක්ස්වාදය නොව අවස්ථාවාදී ලෙනින්වාදය බව දැනගැනීමට මාක්ස්වාදයේ දරිද්‍රතාව කියවන්න. ජ වි පෙ සබරගමුවේ හා උතුරු මැද පළාතේ ලබාගත් ඡන්ද ප්‍රතිශත පිළිවෙළින් 2.2ක් හා 4.9ක් විය. ජ වි පෙ පසුගිය මහාමැතිවරණයේ දී තරග කෙළේ සංධානයේ සංරචකයක් වූ පක්ෂයක් ලෙස ය. සංධානයේ අපේක්ෂකයන් ලෙස ඔවුන්ට මනාප ලැබිණි. එහෙත් ඒ මනාප තමන්ට ජ වි පෙ අපේක්ෂකයන් ලෙස ලැබුණු ඡන්ද යැයි ඇතැම් ජ වි පෙ සාමාජිකයන් අධිතක්සේරු කර ඇත. තනි පක්ෂයක් ලෙස ගතහොත් ජ වි පෙ අද ඇත්තේ 1982 සිටි තැනටත් පහළ මට්ටමක ය. එවර ජනාධිපතිවරණයේ දී

© Prof. Nalin De Silva

විජේවීර මහතාට ජාතික මට්ටමෙන් 3%ක පමණ ඡන්ද ප්‍රමාණයක් ලැබිණි. එහෙත් අද ජාතික මට්ටමෙන් එපමණවත් ඡන්ද ප්‍රතිශතයක් ලබාගැනීමේ හැකියාවක් ඒ පක්ෂයට නැත.

එවැනි පසුබිමක ජ වි පෙ ක්‍රියාකරනු ඇත්තේ කෙසේ ද? ඔවුන් තම පරාජය නො පිළිගනු ඇත. එය ආණ්ඩුවේ මැරකම් ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදයේ ප්‍රෝඩාවන් ආදිය මත සිදු වු දෙයක් මිස පක්ෂයේ වැරදි ප්‍රතිපත්තිය නිසා සිදුවුවක් යැයි නොකියනු ඇත. ලෝකයේ ඇති වූ වඩාත්ම මනෝරාජික සමාජවාදී ප්‍රවාදය වූ මාක්ස්වාදය කරෙන් බිම තැබීමට ජ වි පෙ ක්‍රියානොකරනු ඇත. ජ වි පෙරමුණෙන් කැඩී ගිය විමල් - නන්දන කණ්ඩායමවත් තවමත් මාක්ස්වාදය අත්හැර නැත. ජ වි පෙරමුණේ මාක්ස්වාදී (නිවැරදිව කිවහොත් මාක්ස්වාදී නොව ලෙනින් - ස්ටැලින් - මාඕවාදී) ප්‍රතිපත්ති කෙසේ වුවත් පසුගිය සමයේ ජාතිකවාදී දේශපාලනයට ඔවුන්ගෙන් යම් මෙහෙයක් ඉටුවිය. ඒ ඉටුකිරීමට හැකිවුයේ පක්ෂය එක් කණ්ඩායමක් ලෙස ක්‍රියාකරන කාලයෙහි දී ය. එබැවින් පක්ෂයේ කැඩීමට තමන් දායක වී යැයි යමකු අහංකාර පරවශව කියන්නේ නම් ඔහුට තමන් කර ඇති වරද පිළිබඳ අවබෝධයක් නැත. ඒ කෙසේ වෙතත් ජ වි පෙ කැඩී ගියේ එවැනි පුද්ගලයකුගේ ක්‍රියාපටිපාටිය නිසා නො වේ. ජාතිකත්වය සමග කෙසේ කටයුතු කළයුතු ද යන්න පිළිබඳ ව පක්ෂයට නිසි අවබෝධයක් නො වි ය. අද ද නැත.

මාක්ස්වාදයෙන් නොකැඩෙන, ජාතිකත්වය සමග කටයුතු කිරීමට නොදන්නා ජ වි පෙරමුණට ඇත්තේ කිසි දා එල නොදරන ඊනියා විප්ලවවාදී මාවත පමණකි. එමග යෑම ඔවුන්ගේ විනාශයට හේතුවනු ඇත. එහෙත් එයට පළමු රටට ද, විශේෂයෙන් ම අසාධාරණයට විරුද්ධ, හැඟීම්වලට වහල්වන තරුණයන්ට ද ඉතා අහිතකාරී තත්වයක් උදාකිරීමට ඉඩ ඇත. අද අප හමුවේ ඇති ප්‍රධාන ප්‍රශ්නයක් වනුයේ තරුණයන් ඉන් ගලවා ගන්නේ කෙසේ ද යන්න ය. ජ වි පෙරමුණටත් වඩා අන්ත පරාජයක් හකීම්ගේ මුස්ලිම් කොංග්‍රසයට හා තොන්ඩමන්ගේ ගේ කම්කරු කොංග්‍රසයට අත්විය. ඒ පක්ෂවලින් එකදු මන්ත්‍රීවරයෙක් තෝරාගනු නො ලැබුණි. ඉතා සීමිත ප්‍රදේශවල සීමිත බලයක් ඇති මේ පක්ෂවලට ද සුබ අනාගතයක් ගැන කතාකළ හැකි නො වේ.

එහෙත් පළාත් සභා ඡන්දයෙන් වඩාත් ම පරාජය වුයේ පළාත් සභාම ය. කිසිම පළාත් සභා ඡන්දයක දී ඒ පළාතේ ප්‍රශ්න සාකච්ඡා නො වේ. උතුරුමැද හා සබරගමුවේ දී සංධානය ඇසුවේ ත්‍රස්තවාදය "යුද්ධයෙන්" පරාජයකිරීම සම්බන්ධයෙන් තම ප්‍රතිපත්තිය ජනතාව පිළිගන්නේ ද නැත් ද යන්න ය. ඒ ජා ප ජනතාව ඇමතුවේ දූෂණය හා ජීවන වියදම මාතෘකා කරගනිමින් ය. පසුගිය සතියේ ජනතාව තීරණය කෙළේ කොටි ත්‍රස්තවාදය පැරදවීම සෑහීමකට පත්වන අයුරින් කෙරෙ නම් ජීවන වියදම් බර වුව ද තාවකාලිකව උසුලා සිටීමට තමන් සූදානම් බව ය. ඒ සියල්ල ජාතික ප්‍රශ්න මිස හා පිළිතුරු මිස පළාත් ප්‍රශ්න නො වේ. ඉන් පැහැදිලිවන්නේ පළාත්සභා යනු තේරුමක් නැති ආයතන බව ය. ආණ්ඩුව හා පළාත් පාලන ආයතන අතරමැද පළාත්සභා යනුවෙන් ආයතන පවත්වාගෙන යෑම අනවශ්‍ය වේ. ඉන්දියාවේ බලපෑම මත ඇතිකළ ඒ ආයතනවලින් අඩුම තරමින් ඇතැයි කියන දෙමළ ජනතාවගේ ප්‍රශ්නවත් විසඳීය නො හැකි ය. අප අනේක වාරයක් කියා ඇත්තේ දෙමළ ජනයාගෙන් බහුතරය උතුරු හා නැගෙනහිර පළාත්වලින් පිට ජීවත්වන බැවින් ඔවුන්ට ඇතැයි කියන ප්‍රශ්න පළාත් මට්ටමකින් විසඳීමට නොහැකි බව ය. අද ඇත්තේ පඬුඅබා රජු ඇතිකළ සිංහල ජාතිය වර්ධනයකර එයට දෙමළ මුස්ලිම් හා අනෙක් ජනවර්ග ඇතුළත් කරගන්නේ කෙසේ ද යන ප්‍රශ්නය ය, එය මධ්‍යයෙහි මිස පරිධියෙහි විසඳිය හැක්කක් නො වේ.

ත්‍රිකුණාමයට පහර දුන් ගුවන්යානා පැමිණියේ කොහෙන් ද හා පහරදීමෙණා පසු ගියේ කොහාට ද යන ප්‍රශ්නය ඇසිය යුතු ය. අද හමුදාව කිලිනොච්චිය හා මුලතිව් වටකර ඇති ආකාරයට ගුවන්යානයකට රට ඇතුලෙන් අහසට නැග නැවතත් රට ඇතුළට එමට හැකි ද? මේ ගුවන්යානා එදත් අදත් පැමිණෙන්නේ පිටරටක, දූපතක හෝ නැවක සිට වීමට ඇති ඉඩකඩ ඉතා අධිකය, කොටි පරදිනු බලා සිටිය නොහැකි රාජ්‍ය මෙන් ම වෙනත් සංවිධාන ද වෙයි. ඒ ඇතැම් සංවිධානයක් සමහර විට රාජ්‍යයෙන් ස්වාධීන ව කටයුතු කරනවා විය හැකි ය. ඒ කෙසේ වෙතත් ආණ්ඩුව මේ පිළිබඳ පරස්පරවලින් තොර පැහැදිලි ප්‍රකාශයක් කළ යුතු ය. අපට පිටරටක් හෝ පිටරටක ඇති සංවිධානයක් සමග හෝ සටන්කිරීමට සිදුවන්නේ නම් අප එයට සූදානම් විය යුතු ය. ඒ සඳහා හමුදාව හා ජනතාව සූදානම් කළ යුතු ය. පඬුඅබාගේ රාජ්‍යය අප කිසිවිටෙකත් යුද්ධයෙන් කිසිවකුට හෝ ලබා දී නැත.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva